## <u>මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු</u>

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද ස්ථිර සේවකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් හා අදාළ ලේඛන තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2026.10.14 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී /ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### <u>ශිල්ප ප්‍රදර්ශක II ශ්‍රේණිය (විදුලි ස්ථාපන හා විදුලි රූප සටහන්)</u>

අවශ්‍ය සුදුසුකම්

(i) (අ) විදුලි ස්ථාපන වැඩ සහ විදුලි රූප සටහන්, විදුලි මෝටර් යන්ත්‍ර එතීම සහ අළුත්වැඩියාව ආදී කටයුතු පිළිබඳ පළපුරුද්ද

සහ

(ආ) විශ්වවිද්‍යාල සේවයේ /රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු විදුලි කාර්මිකයෙකු ලෙස අවම වශයෙන් වසර 15ක සේවාවක් තිබිය යුතුය.

හෝ

(ii) විශ්වවිද්‍යාල සේවයේ /රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක ඉහත (i) (අ) කොටසේ දැක්වෙන ක්ෂේත්‍රයක පුහුණු විශේෂ ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය : U-MN 1 (III) - රු. 49,475-17 X 540- 58655/- (මාසික)
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛ ලිපි අංක 06/2020 අනුව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තනතුරකින් වෙනත් තනතුරකට පත්කිරීමේදී රජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 09 වන වගන්තියට අනුව අදාල වැටුපෙහි පිහිටවනු ලැබේ.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
2026.09.23